# III මහ බැංකු ගිණුම් හා ගනුදෙනු

1962 වසරේ මහ බැංකුවේ මුදල් පිළිබඳ ගිණුම් II වැනි පරිශිෂ්ටයේ 6 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1961 වසර හා සැසඳීමේ දී දක්නට ලැබෙන ප්‍රධාන වෙනස්කම් පහත දක්වේ.

| | වෙනස | |
|---|---|---|
| | රුපියල් දශලක්ෂ | සියයට ගණන |
| මුළු ඉල්ලුම් වගකීම් .. .. .. .. .. | +107·5 | +10·9 |
| සංසරණයේ ඇති මුදල් .. .. .. .. .. | + 25·6 | + 3·3 |
| ඉල්ලුම් තැන්පතු .. .. .. .. .. | + 81·9 | +37·3 |
| (මින් වෙළෙඳ බැංකුවල) .. .. .. .. | + 20·1 | +23·2 |
| ජාත්‍යන්තර සංචිතය .. .. .. .. .. | — 32·6 | —17·7 |
| දේශීය වත්කම් .. .. .. .. .. .. | +158·2 | +17·1 |
| රජයේ හා රජය ඇපවූ සුරැකුම්පත් .. .. .. | +175·8 | +24·8 |

\+ වැඩිවීම

— අඩුවීම

1962 අවසානයේදී, ව්‍යවහාර මුදල් වලට හා ඉල්ලුම් තැන්පතු වලට ජාත්‍යන්තර සංචිතයේ පැවැති අනුපාතය අඩු විය. 1961 දී මේ අනුපාතය 18·8% ක් වූ අතර, 1962 අවසාන වන විට එය 13·9% ක් විය.

රන්පවුම්–ඩොලර් මිල ප්‍රමාණයේ වෙනස්වීම්වලට අනුරූපව ඇමරිකානු ඩොලරයක මහ බැංකු මිල ප්‍රමාණය ද (1අා (ii) පරිශිෂ්ටයෙහි දක්වා ඇති පරිදි) විටින් විට වෙනස් වෙයි.

රන්පවුම සහ ඉන්දීය රුපියල සඳහා මහ බැංකු මිල ප්‍රමාණයෙහි වෙනසෙක් අවුරුද්ද තුළ දී ඇති නොවිණි. එකී මිල ප්‍රමාණයන් පහත දක්වේ.

| | | | විදිලි පුවත් මගින් මිලට ගැනීම | | විදිලි පුවත් මගින් විකිණීම |
|---|---|---|---|---|---|
| රන්පවුම් .. | එතැන් | .. | සි. 1 පැ. 63/64 | .. | සි. 1 පැ. 6 1/32 |
| (ලංකා රුපියලකට) .. | ඉදිරි | .. | එතැන් සඳහා | .. | එතැන් සඳහා |
| | (සමස තෙක්) | | මසක වට්ටම පැ. 1/128 | | මසක අධිමිල පැ. 1/128 |
| ඉන්දීය රුපියල් .. | එතැන් | .. | රුපියල් 99 3/4 | .. | රුපියල් 99 13/16 |
| (සියයට) .. | ඉදිරි | .. | එතැන් සඳහා | .. | එතැන් සඳහා |
| | (සමස තෙක්) | | මසක වට්ටම රු. 1/32 | | මසක අධිමිල රු. 1/32 |

මහ බැංකුවේ විදේශීය විනිමය ගනුදෙනු සම්පූර්ණ වශයෙන් 11 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. පසුගිය වසර හා සසඳා බලන විට මේ වසරේ එතැන් මිල දී ගැනුම් වල වටිනාකම රුපියල් කෝටි 44·76 ක් සහ එතැන් විකුණුම්වල වටිනාකම රුපියල් කෝටි 56·94 ක් විය. 1961 එතැන් මිල දී ගැනුම් වල වටිනාකම රුපියල් කෝටි 34·21 ක් වූ අතර එතැන් විකුණුම් වල වටිනාකම රුපියල් කෝටි 50·31 ක් විය. ඉදිරි මිලට ගැනීම් සඳහා ගිවිසගත් ගිවිසුම්වල වටිනාකම රුපියල් කෝටි 20·26 ක් (1961 රුපියල් කෝටි 22·18) විය. ඉදිරි විකුණුම් ගිවිසුම් වල වටිනාකම රුපියල් කෝටි 14·45 ක් විය. (1961 රුපියල් කෝටි 6·16 ක් විය). ඉදිරි මිලට ගැනුම් යටතේ පසුගිය අවුරුද්දේ ඉතිරියත් සමග ලැබුන මුළු ප්‍රමාණය රුපියල් කෝටි 21·19ක් විය. ඉදිරි විකුණුම් ගිවිසුම් යටතේ විකුණූ ප්‍රමාණය රුපියල් කෝටි 13·37 ක් විය. මේ අනුව මිල දී ගැනුම් වල එකතුව (ඉදිරි ගිවිසුම් යටතේ ලැබුනු සහ එතැන්) රුපියල් කෝටි 65·95 ක් විය. විකුණුම්වල එකතුව රුපියල් කෝටි 70·31 ක් විය.

### ව්‍යවහාර මුදල් නිකුතුව

දිවංගත අගමැති, ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පිළිරුව සහිත අලුත් රු. 50/– හෝ නෝට්ටුවක් මේ වසරේදී නිකුත් කරන ලදි. අලුත් නෝට්ටුව කලින් නිකුත් කොට තුබූ රුපියල් 50/– හේ නෝට්ටුවට වඩා ප්‍රමාණයෙන් කුඩාය. නව නෝට්ටුවේ ප්‍රමාණය $5\frac{15}{16}'' \times 3\ 1/10''$ කි.

මේ නෝට්ටුවේ ඉදිරිපස, මැදින් පටන් ගෙන උඩ–යටි දෙකෙළවරට විහිදී යන සේ සංකීර්ණ නන් පැහැයෙන් යුතු මෝස්තරයක් මතුපිට ප්‍රධාන වශයෙන් ම නිලෙන් මුද්‍රණය වී ඇත. පිළිරුව නෝට්ටුවේ දකුණු පැත්තේ ඇති පනේලයේ ද, දිය ලකුණ වූ ''වීරාගත සිංහ ලකුණ'' වම්පැත්තේ ඇති පනේලයේ ද වෙයි. නෝට්ටුවේ දකුණු පැත්තේ උඩ සිට කෙළින් අතට ලෝහමය නූලක් කවා ඇත.

නෝට්ටුවේ පිටුපස ද ප්‍රධාන වශයෙන් ම නිලෙන් මුද්‍රණය වී ඇති අතර, සඳකඩ පහනේ සහ පඩිවල අනුරුවක් දක්වේ. දකුණු අත පැත්තේ, නා නා ප්‍රමාණයෙන් වූ සියුම් අකුරු වලින් යුතු කවාකාර පනේලයකි.

මේ අලුත් නෝට්ටුව, මෙයට පෙරාතුව නිකුත් කැරුන සම වටිනාකමින් යුතු නෝට්ටු සමග භාවිතයට වැටිණි.

### ආදායම සහ වියදම

මේ වසරේ මහ බැංකු ආදායම රුපියල් 2,80,50,100·01 ක් විය. වසරේ මහ බැංකු වියදම, මුදල් නීති පනතේ 38 වැනි වගන්තියේ විධිවිධානවලට අනුව සංචිත සඳහා වෙන් කැරුන රුපියල් 93,33,848·22 ඇතුළුව, රුපියල් 1,80,50,100·01 ක් වී ඇත. ශුද්ධ ලාභය වූ රුපියල් කෝටිය මුදල් නීති පනතේ 39(ආ) වගන්තියේ විධිවිධාන අනුව අතිරික්තයට බැර කැරිණි. එසේ කැරුනේ 1962 දෙසැම්බර් අවසානය වන විට මහ බැංකුවේ ප්‍රාග් ධන ගිණුමේ එකතුව මහ බැංකුවේ මුළු වත්කම්වල හා විදේශීය මුදල් වලින් ඇති මහ බැංකු වත්කම්වල වෙනසින් සියයට 15 කට අඩු වූ නිසා ය. දනට ඇති අතිරික්තය රුපියල් කෝටි 4 කි.

### බැංකු පරිපාලනය

1962 වසරේදී, බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව, මුදල් නීති පනතේ 29(1) වැනි වගන්තිය ප්‍රකාර, වෙළෙඳ බැංකු 6 ක් ද, මුදල් නීති පනතේ 29(2) වැනි වගන්තිය ප්‍රකාර මුදල් මණ්ඩලය විසින් කැරුන විධානයකට අනුව, වෙළෙඳ බැංකුවක් නොවන බැංකු ආයතනයක් ද පරීක්ෂා කර බලන ලදි.

1957 අංක 42 දරන බැංකු හර බද්ද ක්‍රියාත්මක කිරීමෙහි ලා සමහර කාර්යයන් තවදුරටත් දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබීය.

1961 අංක 65 දරන මුදල් නීති පනතේ, බැංකු ගිණුම් ඇරඹීම හා සම්බන්ධිත III වැනි කොටසේ අවශ්‍යතා සඳහා, බලය ලත් නිලධාරියා වශයෙන් බැංකු පරිපාලන අධ්‍යක්ෂ මුදල් ඇමති තුමා විසින් පත් කරනු ලැබීය.